

# VIVACIOUS VICTORY

*by Sanjaya Wimalaratne - UK*

It is with patriotic fervour and exuberance that we join the euphoria on the complete defeat of the ruthless Tamil Tiger Terrorist Organisation militarily by the Sri Lankan Armed Forces on the 19th May 2009. It brings great relief to all Sri Lankans as these terrorists had been plaguing our country and the people for almost three decades.

At this precious juncture we bow our heads to express our esteemed appreciation of and our gratitude to, our armed forces who with complete dedication and great courage fought many valiant battles day and night under extremely difficult circumstances in order to achieve this victory, the commanders of our army, navy and airforce who led these forces with a correct vision and strategy often from the front and our President Mr.Mahinda Rajapakse as supreme commander of the forces who gave the lead to the whole task of conducting this war with an unshaking and firm resolve and the correct vision all the time and the government which stood by him in this whole struggle, and further the patriotic Sri Lankan people who for so many years underwent all harassment and faced atrocities brought about by a vicious inhuman enemy and supplied the encouragement for this victorious struggle bearing up all the difficulties with immense patience.

Our grateful thanks should also be conveyed to the patriotic Sri Lankans abroad, in the West, the Middle East and Australia who for the last three decades, continued a relentless struggle against the enemy who had been openly aided and abetted by the so called Western liberal politicians, the media and all who were opposed to the struggle of the patriots against division of our beloved motherland. These patriots rendered an invaluable service organising campaigns, demonstrations, taking part in radio and TV debates, writing to politicians in those countries, publicity work, fundraising etc. under great odds and difficulties often foregoing even their personal well being which we should never forget.

## Deepest rememberances and pledges of support

Equally, bowing our heads with deepest affection, honour and sorrow we shall remember for ever the valiant heroes and heroins who laid down their precious lives for a better future for our country and the generations to come.

### Our most pious wish is "May they attain Nibbana"

In the same vein we express the whole nation's indebtedness to the parents of the above heroes and heroines who gave birth to them and brought them up so well to serve the country, their spouses and children, all of whom have been unexpectedly orphaned by the untimely demise of their loved one.

In the same way our deepest gratitude and debt has to be expressed for the tens of thousands of heroes and heroins who although they survived the war have been disabled physically or/and mentally for the rest of their lives and have to depend on some assistance.

The whole nation should make a pledge at this juncture that all the above recorded persons would be given appropriate assistance to continue without any hardship or destitution of any form for the rest of their lives.

## DHARMAVIJAYA OR THE VICTORY OF JUST OVER THE UNJUST

This was a great victory for forces of Dharma or justice over the forces of Adharma or injustice.When we look back in history we can see similar victories all over the world. One recent example is the vicious unjust Nazi and Fascjst forces of Hitler and Moussolini being completely defeated by the just democratic and socialist of the allies.

The Tamil Tiger movement was built upon the underlying vicious motives of hatred, jealousy ,anger against the country and people of all communities. Its weapons were terror, falsehood , the gun, the bomb and all forms of destruction of life and resources.They went on destroying all who stood for justice such as leaders of all communities who stood up for justice (Dharma) and rejected their violence.

But in the end even after so many long years of suffering, lost lives etc. the forces of dharma led by the people, the government and the armed forces proved capable of completely destroying these evil forces of terrorism thus proving that in the end forces of Dharma wins over the forces of Adharma eventually. This as the ancients said is Lokadharma or the way of the world.

## One country one nation and one flag

Throughout its long history Sri Lanka has been always one country one nation under one flag. Mother Lanka always embraced all ethnic groups Sinhalas, Sri Lankan Tamils, Muslims, Indian Tamils, Malays, Burgers etc., all who settled here at various times equally as her children i.e. the component peoples of this great nation. This position remained the same even under the British - the only time the whole country was completely under an alien power.

Then in 1948 when Sri Lanka (called Ceylon) won independence it continued as one country one people and one flag. The only change was the British flag being brought down and the Sri Lankan flag being hoisted. It has remained the same upto today.

Aided and abetted by the unpatriotic elements inside the country and some western countries spearheaded by Norway and others, the tiger terrorists attempted to foist on Sri Lanka their myth of an 'Eelaam' which has been proved to be a sham and completely wiped out with the defeat of the Tigers. Even though there were such attempts at disruption in the recent past all in Sri Lanka whatever ethnic or religious group have continued to live as one nation under one flag uninterrupted. This fact has to be emphasised and that this will always remain so.

This issue of Lanka Viththi is dedicated to our vivacious victory and to discuss the way ahead in order to build up our country to a great future.

**Jaya Veva !**
**( May you be victorious !)**

# විස්මිත විජයග්‍රහණය

## 1 වන පිටුවෙන්..........

එහෙත් බොහෝ දේශප්‍රේමීන් මෙන් මෙම ලංකාවිත්ති පුවත්පත ද මෙහි මුල් පිටුවේ මස්තකයේ සැමදා සඳහන් වන **මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය** යන ආදර්ශ පාඨය අනුව යමින් අපේ අභිමානවත් සන්නද්ධ හමුදා කෙසේ හෝ ජීවිත පරිත්‍යාගයෙන් අප මව්බිම දිනක රුදුරු ත්‍රස්තවාදයෙන් මුදා ගන්නා බව අපි ඒකාන්ත වශයෙන් දැන සිටියෙමු. අප රටට හිතකර පාලකයෙකු ලැබීම ඒ අපේ ප්‍රාර්ථනාව සඵල වන තවත් හේතුවක් විය.

මෙම ශ්‍රේෂ්ඨ කාර්‍යය ඉතා සාර්ථකව ඉටුකිරීමේලා ඉමහත් ධෛර්‍යයකින් මෙන්ම පූර්ණ කැපවීමකින්ද දිවා රෑ නොබලා, ජීවිත පරදුවට තබා සටනෙහි යෙදුණු අප ත්‍රිවිධ හමුදාවලටද, ඒ උදෙසා නොසැලෙන, නිවැරදි සහ අතිශය උපක්‍රමශීලී නායකත්වයකින් එම සටන්බිමේ ඉදිරියෙන්ම සිටිමින් සටන් මෙහෙය වූ ත්‍රිවිධ හමුදා සෙන්පතීන්ටද, මේ සියළු යුද කටයුතු නිසි ලෙස අධීක්ෂණය කරමින් එයට නොසැලෙන නායකත්වය දුන් සකළ හමුදා-වන්ගේ ප්‍රධාන සෙන්පති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාද, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජ පක්ෂ මැතිතුමන්ද ප්‍රමුඛ ශ්‍රී ලංකා රජයටද, මේ සටන් පැවති වසර ගණනාවක දීර්ඝ කාලයක් පුරා ඒ සියළු දුක් කම්කටොළු අමාරුකම් ඉවසා විඳ දරමින් මේ සියල්ලටම දිරිය සැපයූ සියළු ජනවාර් ගික කොටස්වල දේශ හිතෛෂී ශ්‍රීලංකා ජනතාවද,

මෙම රුදුරු දෙමළ ත්‍රස්තවාදය ආරම්භ වූ දා සිටම විවිධ විදේශීය රටවල වෙසෙමින්, තම මව්බිම කෙරෙහි භක්තියෙන් සහ සහෝදර ජනතාව කෙරෙහි ආදරයෙන් යුතුව තමනට කළහැකි සෑම මෙහෙයක්ම දැඩි වෙහෙසක් ගෙන ඉටුකරමින් දෙමළ කොටි ත්‍රස්තවාදය පරාජය කරන්නට උද්ඝෝෂණ විරෝධතා හඬ නගමින් ශ්‍රීලංකාවට සහාය දෙන ලෙස විදේශ රටවල රජයයන්ට බලපෑම් කරමින් එසේම ත්‍රස්තවාදී අනුගාමිකයන් හා පැටලෙමින්, මේ අවසානය දක්වා සංගම් සංවිධාන වශයෙන් හෝ පුද්ගලික වශයෙන් හෝ අසීමිත මෙහෙයක් ඉටුකළ සියළු විදේශගත දේශප්‍රේමී ශ්‍රීලාංකික ජනතාවටද ආදී වූ මේ සියළු දෙනාටම කෘතඥපූර්වකව, ගෞරව පෙර දැරිව අපි හිස නමා ගෞරව සම්මාන පුදකර සිටිමු.

එසේම පසුගිය දශක තුනක කාලයක් පුරා මේ සටන්වලදී ජීවිතක්ෂ යට පත්වූ දස දහස් ගණනක (මේ අවසන් සටනේදී පමණක් මියගිය සංඛ්‍යාව **6000** කට අධිකය.) අප සියළු හමුදා වල සෑම මට්ටමේම විරුවන් හා වීරවරියන් ඉතා සංවේගයෙන් මෙන්ම ඉතා ආදර ගෞරවයෙන් යුතුව හිස නමා බුහුමන් දක්වමින් සිහිපත් කරමු.

ජාතියේ සියළුම ජනතාවගේ වර්තමානය සහ ඉදිරි පරම්පරාවල අනාගත ශුභසිද්ධිය උදෙසා තමා උපතින් ලද වටිනාම දායාදය වන තම ජීවිතය පුදා උතුම් පරමාර්ථයක් ඉටුකළ මව්බිමේ උදාර විරුවන්ට සහ වීරවරියන්ට නිවන් සැප ලැබේවායි ප්‍රාර් ථනා කරමු. ඔවුන්ට අප සමස්ත දේශයම ණය ගැතිවන අතර එම කැපවීම කිසිදා අමතක නොකළ යුතුය.

එසේම එම වීරයන් වීරවරියන් ලොවට බිහිකළ ඒ සියල්ලන්ගේ දෙමාපියන්ටද, ඒ අයගේ ඒ අභාවයන් නිසා අකාලයේ අනාථ බවට පත්වූ ඒ අයගේ ජීවන සහකාර සහ කාරියන් ඇතුළු දූදරුවන්ටද, මේ මුළු කාලය තුළ යුදවැද නොමිය මුත් කායික හෝ මානසික ආබාධයනට ගොදුරුව ඉදිරි ජීවිත කාලයම යම් දුබලතාවලින් පෙලෙන්නට සිදුව ඇති දහස් ගණනක රණවිරුවන් වීරවරියන් යන සියළු දෙනාටද මුළු ජාතියම සදා ණයගැති බව සඳහන් කරන අතරම අප හදපත්ලෙන් නැගෙන කෘතඥතාව ඔවුන් වෙත පළකර සිටිය යුතුය.

එසේම ඉහත සඳහන් කළ සියළු දෙනාටම තමාගේ ආදරණීයයන්ගේ වියෝගය හෝ තම ආබාධිත තත්වය මත හෝ මුළු ජීවිතය තුළම අසරණ බවකට පත්වීමෙන් තොරව ජීවත්වීමේ හැකියාව ලබාදීමට මුළු ජාතියේම කැපවීම සාක්ෂාත් කරලමු.

## ධර්ම විජයයක්

ලෝක ධර්මතාවට අනුව අධර්මයට කවර විටෙකවත් වැඩිකලක් ජය ලබා සිටිය නොහැකිය. ලෝක ඉතිහාසය විමසා බලන කල මේ තත්වය ලොව තුළ සෑම විටම පැවති බව පෙනී යයි. මෑත ඉතිහාසයේම මහා බලවත් රාජ්‍ය ගොඩනගා ගත්තද නට්සිවාදී හිට්ලර් ලාට, පැසිස්ට්වාදී මුසෝලිනීලාට අත්වූ ඉරණමම මෙය සානාථකර ලයි. කොටි ත්‍රස්තවාදය ගොඩනැගුණේත් රටේම සකල ජනතාව සමග තිබුණු වෛරය ඊර්ෂයාව ක්‍රෝධය පදනම් කරගත් මිත්‍යාව බොරුව ත්‍රස්තවාදය ගිනි අවිය බෝම්බය මත හිංසාව පදනම් කර ගෙනය. එය පවත්වාගෙන ගියේද එයට නොමග යැවීමට හැකිවූයේද මන්ද බුද්ධිකයන් රැසකගේ කර මතිනි. හැම ජනවාර්ගික කොට්ඨාශයකටම අයත් දේශපාලක යින් ඇතුළු නායකයින් සහ ධාර්මික අදහස් ඇත්තන් නිර්දය ලෙස ඝාතනය කර ලීම මතය. සම්පත් විනාශ කරලීම මත ය. ලොව කවදාත් සිදුවන පරිදි රටේ අභ්‍යන්තර වශයෙන්ද බාහිර ලෝකයේ මද ඒවාට ගැලපෙන ආකල්ප ඇතිය වුන් සුළු පිරිසක්ද උන්ට උල් පන්දම් දුන්හ. එය අපි පැහැදිලිව දුටුවෙමු.

නමුත් සිය දේශය හා ජනතාව මුන්ගේ කෲර ක්‍රියාදාමයන්ගේ ග්‍රහණයෙන් මුදවා ගැනීම ඒකායන අරමුණ කරගෙන, සත්‍යය මත පිහිටා, නිර්මල ධාර්මික පදනමකින් යුක්තව අප ජාතිය, ත්‍රිවිධ හමුදාවන් සහ රජය ගෙනගිය සටන විජය ග්‍රහණයකින් අවසන් වෙමින්, එම විෂම සතුරන් සියළුදෙනම එක රොත්තට සුණු විසුණුවී, නැති භංගවීයාම ලෝක ධර්මතාවට අනුවම සිදුවීය.

## එක් රටක්, එක් ජාතියක්, එක් ධජයක්

අප දීර්ඝ ඉතිහාසය තුළම ශ්‍රීලංකාව පැවතියේ එක් රටක් එක් ජාතියක් ලෙස එක් ධජයක් යටතේ බව අමුතුවෙන් කිවයුතු නොවේ. උතුරේ ද්‍රවිඩ ඉන්දියානු ද්‍රවිඩ, මුස්ලිම්, මැලේ, බර්ගර් ආදී විවිධ ජනවාර්ගිකයින් එහි විවිධ කාලවල සිට පදිංචිව සිටියද ඒ හැමට අප ජාතියේම දරුවන් ලෙස ශ්‍රීලංකා මාතාව දිගටම නොවෙනස්ව සැලකුවාය. බ්‍රිතාන්‍ය පාලනය යටතේද එය එසේම පිළිගැනිණ.

1948 දී අප නිදහස ලැබූයේද එකම ජාතියක් වශයෙන් එකම ධජයක් යටතේය. පැවතියේද එකම සිංහ ධජයක් යටතේය. ලංකා සිතියමේ යම් කොටස්වල රතුපාට තවරාගෙන මුන්ගේ මේ ඊළාම් සිහිනය ඉදිරිපත් කරමින් කෲර ලෙස ඇරඹියේ රට දෙකඩ කිරීමේ රටේ ජනතාව භේද කරලීමේ නීච ප්‍රයත්නයකි.

රටේම දේශද්‍රෝහී කැණහිලුන් පිරිසක් ද ඊට උල්පන්දම් දෙමින් උන්ට බොරු ඊළාමයක් කෙටි කාලයකට ගෙනයන්නට මහ පැදුවද කොටියන් බොරුවෙන් ගොඩ නගාගත් රූකඩ හමුදාවන් බොරු පොලීසි අධිකරණ බැංකු ආදිය කුඩා ළමයින් සෑදූ සෙල්ලම් ගෙවල් වැනිවිය.

මේ මුළු කාලය තුළමද රටේ පරිපාලනය සේවාවන් සහ මුදල් නෝට්ටු ස්ථාවර බැංකු ආදී සියල්ලම අඛණ්ඩව පැවතියේය. ඒ එකම සිංහ ධජයක් යටතේය.

මේ ධර්ම යුද්ධයේදී ධාර්මික බලවේගය නිසා උන් මේ ඇටවීමට තැත්කළ සියල්ල පූළහට අසුවූ අර සෙල්ලම් ගෙවල් සේ සුනුවිසුණු වී ගොස් ඇත. මෙය විශේෂයෙන් සඳහන් කළ යුත්තේ දැන් මතුවෙන්නට දහලන, ඉතිහාසයේ කවදාවත් නොතිබුණු ඊනියා ඊළම් රාජ්‍යයක් ගැන කියමින් බහුබූත කොඩියක් අටවාගෙන ඉතිහාසය විකෘති කරලීමේ ලොව රවටන කූට දෙමළ ප්‍රයත්නය බිඳලීමටය.

ජනතාව ශ්‍රීලංකා රජය සහ හමුදා ඒ ධර්ම යුද්ධයෙන් කළේ මේ කොටි වේශයක් ගෙන පෙනී සිටි කැනහිළුන් පිරිස විනාශකර ඒ එකම සිංහ ධජයක් යටතේ පැවති පාලනය තහවුරුකර ලීමටය.

## ලංකාවිත්ති මේ කලාපය

මේ විශිෂ්ඨ ජයග්‍රහණයෙන් පසු පළවන පළමු කලාපය වන මෙය ඒ ජයග්‍රහණය එහි පසුබිම ඉදිරිය සමාජ වෙනස්කම් ආදී විවිධ අදාල කරුණු සාකච්ඡාකරලීම සඳහා යොදවා ගැනීමට අපි තීරණය කළෙමු.

අප රටේ ඉදිරි කාර්‍යයව ඇත්තේ දුෂ්කර වූ විෂම බලවේගයන්ට මුහුණ දෙමින් අප රටට ජනතාවට හැකි ඉක්මනින් සෙත සලසමින් අනාගතය ශක්තිමත් කර ගැන්මේ ඉමහත් කාර්ය සම්භාරයකටය. එය සැබෑ අභියෝගයකි

එහෙත් මේ සියල්ලටද අප ජාතිය නොසැලී නොබියව මුහුණ දෙමින් ජය ලබන බව අපි අවධාරණය කර සිටිමු.

**ජයවේවා!**